**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව (ගෞරව) - 4 මට්ටම**
**අවසාන පරීක්ෂණය- 2023/2024**
**LLU 4610 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය 2**
**කාලය - පැය 3**

---

දිනය -: **2024** මැයි **22** වේලාව -: ප.ව. **1.30 –** ප.ව **04.30**

---

මුළු ප්‍රශ්න ගණන - 08

ප්‍රශ්න **<u>05 කට පමණක්</u>** පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. “ශ්‍රී ලංකා පශ්චාත් යටත් විජිත යුගය තුළ මානව හිමිකම් ආරක්ෂා කිරීම උදෙසා වන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුව ප්‍රගතිශීලී දිශාවකට විකාශනය වී ඇත”.

    ඔබ මෙම ප්‍රකාශය සමග එකගවන්නේද?

    ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන අත්දැකීම් ඇසුරින් විවේචනාත්මකව අගයන්න.

**(ලකුණු 20)**

02. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ වෙත යොමුවෙමින් පහත සිද්ධීන්හී පාර්ශවයන් වෙත උපදෙස් දෙන්න.

    (අ).අවමංගල්‍යයකට සහභාගී වී සිය නිවසට පැමිණෙමින් සිටි ප්‍රභාශ්ව, පොලිසිය විසින් පෙ.ව.1.30 ට අත් අඩංගුවට ගන්නා ලදි.ඔහුගේ මෝටර් සයිකලය නැවතූ පොලිසිය ප්‍රකාශ කළේ ඔහු සන්තකයේ මත්කුඩු තිබේද යන වග සම්බන්ධයෙන් ඔහුව පරීක්ෂාවට ලක්කෙරෙන බවයි.ප්‍රභාශ් තමා නීති ශිෂ්‍යයෙකු බව පවසමින් එයට විරෝධය ප්‍රකාශ කළේ පොලිසියට ඔහුව ස්පර්ශ කිරීමට හැකියාවක් නොමැති බව පවසමිනි.පොලීසිය සමඟ අදහස් හුවමාරුව අතරතුරදී එක් පොලිස් නිලධාරියෙකු විසින් ඔහුට කම්මුල් පහරක් ගැසුවේය.ඔහුව පොලීසිය වෙතට ඇදගෙන ගිය අතර අඛණ්ඩව ඔහුට පහර දුන්නෝය.ඔහු ඇප මත නිදහස් වූ පසු ඔහුව රෝහලට ඇතුළත් කරන ලදි.වාර්තා දක්වන්නේ ඔහුගේ උරහිස්වල අස්ථි බිඳීමකට ලක්ව ඇති බවයි.

**(ලකුණු 10)**

    (ආ).තුෂ් යනු මවක් වන අතර ඇය සුළු වාර්ගික ජන කොට්ඨාසයකට අයත් වේ.ඇයගේ අවුරුදු 15 ක් වියැති දියණිය වන සාමා පාසලේදි පිරිමි ගුරුවරයෙකුගෙන් ඇයට හිරිහැර සිදුවූ බවට තම මවට පැමිණිළි කළාය.තුෂ් පාසලට ඉක්මනින් ගිය අතර විදුහල්පතතුමාට මෙම චෝදනාව පිළිබඳ දැනුවත් කළාය.නමුත් විදුහල්පතිතුමා ඇයට සවන්දීම වෙනුවට ඇය පාසලේ කීර්තිනාමයට හානි කරන බවට පවසමින් ඇයට චෝදනා කළේය.සාමා සිද්ධියෙන් පසුව මානසික අවපීඩන තත්වයකට

පත් වූවාය. තමා වෙනස් වූ ජනවර්ගයකට අයත් වන බැවින් තමාගේ පැමිණිල්ල නොසලකා හැරි බව ඇයගේ විශ්වාසයයි.

**(ලකුණු 10)**

03. 'X ' නම් රාජ්‍යය, සිවිල් යුද්ධයකට මැදිව සිටින රාජ්‍යයකි. පවතින ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් රජය විසින් හදිසි අවස්ථා තත්වයක් ප්‍රකාශයට පත්කළේය. එම හදිසි අවස්ථා රෙගුලාසිය තුළ පහත පරිදි දැක්වේ.

2.1: පුද්ගලයන් පස්දෙනෙකුට වඩා රැස්වන ඕනෑම රැස්වීමක් නීති විරෝධී ලෙස සැලකේ. කිසිදු පුද්ගලයෙකුට යුද්ධ කිරීම විවේචනය කිරීම හෝ හමුදාව අධෛර්යමත් කරමින් කිසිවක් ප්‍රකාශනය කිරීම කල නොහැකිය.

හාෂී යනු පර්යේෂණාත්මක ජනමාධ්‍යවේදිනියකි.යුධ හමුදාපති සම්බන්ධ අක්‍රමිකතා පිළිබඳ තොරතුරක් ඇයට ලැබේ. ඇය මෙම ගණුදෙණුව සම්බන්ධ කරුණු හෙළිවන ආකාරයට වාර්තාවක් ලියයි. රජය විසින්,ඇයව හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගන්නා ලෙසට පොලිසිය වෙත දන්වයි.තවද එම පුවත් ප්‍රචාරණ ආයතනය ද හදිසි නීතිය යටතේ තහනම් කරන ලදි.

ජනමාධ්‍ය නිදහස සම්බන්ධයෙන් කටයුතු කරන සිවිල් සමාජ සංවිධානයක් වන තරුණ ජනමාධ්‍යවේදී සංගමය (YJA) හදිසි නීති රෙගුලාසි සහ හාෂීගේ සිදුවීමට අදාළ අනෙකුත් මර්දනකාරී ක්‍රියා අභියෝගයට ලක් කිරීමට අදහස් කරයි.

YJA ට අයැද සිටිය හැකි මූලික අයිතිවාසිකම් ඉල්ලීම් සාකච්ඡා කරන්න. ඔබගේ සාකච්ඡාව තුළ නෛතික ස්ථිතියට අදාළ නියමයන් සලකා බලන්න.

**(ලකුණු 20)**

04. ඔබගේ විශ්ව විද්‍යාලය මගින් සංවිධානය කළ මානව හිමිකම් දිනයට අදාළව පහත සඳහන් මාතෘකා යටතේ ඔබට කථනයක් ඉදිරිපත් කිරීමට ආරාධනා ලැබී ඇත.ඔබ ඔබගේ කථනය පහත සඳහන් තේමාවන් පිළිබිඹු වන අන්දමින් ආකෘතිගත කළ යුතුය.

(අ).මූලික අයිතිවාසිකම් මත පවතින සීමා
(ආ).රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම.

අවශ්‍ය අවස්ථාවලදී ඔබගේ පිළිතුර අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා නඩු නීතිය ඔස්සේ තහවුරු කරන්න.

**(ලකුණු 20)**

05. "තනි පුද්ගලයෙකු වෙත හෝ ආයතනයක් වෙත බලය කේන්ද්‍රගත වීම වළක්වාලීම සඳහා ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන්හි බලය බෙදාහැරීම අත්‍යවශ්‍ය අංගයක් වේ.බලය බෙදා හැරීම කෙලෙස සිදුවිය යුතුද යන්න තීරණය කිරීම අදාළ රාජ්‍යයෙහි ඉතිහාසය ,සංස්කෘතිය සහ සමාජ ව්‍යුහය මත බොහෝ විට පදනම් වේ".

ඔබ ඉහත ප්‍රකාශය සමග සමඟ එකඟ වන්නේ ද?

බලය බෙදා හැරීමේ ප්‍රධාන ක්‍රමවේද වෙත අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය ප්‍රජාතන්ත්‍රික රාජ්‍යයන් ද්විත්වයක උදාහරණය සහිතව පැහැදිලි කරන්න.

ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු නීතිය යටතේ තහවුරු කරන්න.

**(ලකුණු 20)**

06. ග්‍රවුන්ඩ්ලන්ඩ් නම් ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ වෙස්ට්ලන්ඩ් පළාත් සභාව ග්‍රවුන්ඩ්ලන්ඩ්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සංවෘත ලැයිස්තුව තුළ පවතින කරුණක් වන විදේශ සම්බන්ධතා කළමනාකරණය කිරීම උදෙසා සිය පළාත තුළ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීමට අදාළ ප්‍රඥප්තියක් සම්මත කර ඇත.ඔවුන් පවසන්නේ ඒ හරහා අන්තර්ජාතික ආයෝජනයන් ඉහළ නැංවීම සිදුවන බවයි. මෙම ප්‍රඥප්තිය සම්මත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බවට තර්ක කරමින් ග්‍රවුන්ඩ්ලන්ඩ්හි මධ්‍යම ආණ්ඩුව මෙයට විරුද්ධත්වය පළ කරයි.

ග්‍රවුන්ඩ්ලන්ඩ්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරමින්, පළාත් සභාවන් සතු ව්‍යවස්ථාදායක බලය යටතේ වෙස්ට්ලන්ඩ් පළාත් සභාව ගෙන ඇති ඉහත ක්‍රියාමාර්ගයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය භාවය පිළිබඳව සාකච්ඡා කරන්න. අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා නඩු තීන්දු ඔස්සේ ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 20)**

07. "ශ්‍රී ලංකාවේ පැවැති වාර්ගික අර්බුදයන්ට පිළිතුරු වශයෙන් දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දීම බලය බෙදා හැරීම සම්බන්ධයෙන් සුවිශේෂී සන්ධිස්ථානයක් සලකුණු කරයි".

ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීම සම්බන්ධව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙහි බලපෑම විවේචනාත්මකව විභාග කරන්න.

ඔබගේ පිළිතුර අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු ඔස්සේ තහවුරු කරන්න.

**(ලකුණු 20)**

08.පහත සඳහන් මාතෘකා අතරින් <u>**ඕනෑම දෙකක් (02)**</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ).පළාත් සභාවන්හි විධායක අධිකාරිය.
(ආ).ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත්බද මහාධිකරණයන්හි බලතල.
(ඇ).පළාත් රාජ්‍ය සේවය.

**(ලකුණු 10x2=20)**

****සියළුම හිමිකම් ඇවිරිණි****